## ප්‍රධාන කෘෂි දේශගුණික කලාපවලට ගැලපෙන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිර්දේශිත පලතුරු ප්‍රභේද

| බෝගය | ප්‍රභේදය | පහතරට | | | මැදරට | | උඩරට | |
|---|---|---|---|---|---|---|---|---|
| | | වියළි | අතරමැදි | තෙත් | අතරමැදි | තෙත් | අතරමැදි | තෙත් |
| අඹ | කර්තකොළොම්බන්, විලාඩ්, මල්වාන, අඹලාවි | ✓ | ✓ | | | | | |
| | වෙල්ලෙයිකොළොම්බන් | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | |
| | ගිරා අඹ, පීටර්පසාන්ඩ් | | | | ✓ | ✓ | | |
| | දම්පර | | | ✓ | ✓ | ✓ | | |
| | ටොම් EJC | ✓ | ✓ | | ✓ | | | |
| රඹුටන් | මල්වාන, මැලයන් රතු, මැලයන් කහ | | | ✓ | ✓ | ✓ | | |
| දොඩම් | බිබිල ස්වීට්, MKD | ✓ | ✓ | | ✓ | | | |
| | ආරෝග්‍යා | | | | ✓ | ✓ | ✓ | |
| නාරං | මධු | | | | ✓ | | ✓ | |
| | රහංගල | | | | | ✓ | ✓ | |
| | ඉන්දු | | ✓ | ✓ | | | | |
| පේර | හොරණ රතු, හොරණ සුදු, පුබුදු, කාන්ති, හොරණ ස්වීට්, රෙඩ් ජයන්ටි, ලංකා ජයන්ටි, හොරණ රෝසි | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | |
| දූරියන් | කසුන්, අඹතැන්න | | | ✓ | ✓ | | | |
| කොස් | ෆාදර්ලෝන්, මහරගම කොත්මලේ, මන්දූර්, රෝස කොස් | | ✓ | ✓ | ✓ | ✓ | ✓ | |
| දෙළුම් | නිමාලි, දයා, නයන | ✓ | ✓ | | | | | |
| කාමරංගා | හනි ස්වීට් | | ✓ | ✓ | ✓ | ✓ | ✓ | |
| පැපොල් | රත්න | ✓ | | | | | | |
| අලිපේර | පොලොක්, ටවර් 2, බූත් 7, සිමොන්ඩ්ස්, පේරාදෙනිය දම්, | | | ✓ | ✓ | ✓ | | |
| | ෆර්ටේ | | | ✓ | ✓ | ✓ | ✓ | |
| පෙයාර්ස් | රහන්ගල | | | | | | ✓ | ✓ |
| බෙලි | බීජ රහිත | ✓ | | | | | | |
| මිදි | කාඩිනල්, ඊශ්‍රායල් බ්ලූ, | ✓ | | | | | | |
| | මස්කට් MI, ෆ්‍රෙන්ච් එම්. අයි | | ✓ | | | | | |

**සැකසීම** - *ජයන්තා ඉලංකෝන්, සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ, ව්‍යාප්ති හා පුහුණු අංශය, පේරාදෙණිය*
*දිස්නා රත්නසිංහ, විෂයානුබද්ධ විශේෂඥ, සේවා සංස්කරණ අභ්‍යාස ආයතනය, ගන්නෝරුව*

**අනුග්‍රහය** - *"අපි වවමු - රට නගමු" ගෙවතු සංවර්ධන වැඩසටහන 2010*


**වැඩි විස්තර ඔබ ප්‍රදේශයේ කෘෂිකර්ම උපදේශක වෙතින් ලබාගත හැක**

Designed by: AUDIO VISUAL CENTRE, Department of Agriculture, Peradeniya. Printed by: AGRICULTURE PRESS, Gannoruwa.

**අපි වවමු - රට නගමු**

**ගෙවතු වගා වැඩසටහන**

# ගෙවත්තට පලතුරු පැළයක්



කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයකි. 2010

## ගෙවත්තට පලතුරු පැළයක්

පලතුරු ගසක් ඔබේ ගෙවත්තට සම්පතක්. එය දිගු කාලයක් පවතින නිසා පැළයක් තෝරා ගැනීම, සිටුවීම හා නඩත්තුව ඉතා සැලකිල්ලෙන් කළයුතු වෙනවා. කෙසෙල්, පැපොල්, පේර වැනි පලතුරු අවුරුද්දේ ඕනෑම කාලයක එලදාව ලබාදෙන අතර අඹ, රඹුටන්, අලිපේර, දොඩම්, මැංගුස්, දූරියන්, මිදි, වැල් දොඩම් වැනි බොහෝ පලතුරු වල එලදාව අවුරුද්දේ එක් කාලයකට සීමා වෙනවා.

මේ ජනප්‍රිය පලතුරු වර්ග හැරුනාම දැනට එතරම් ප්‍රචලිත නැති උගුරැස්ස, ජම්බු, ජම්බෝල, නාරං, බෙලි, වෙරළු, සැපදිල්ලා, මසං, නමිනං වැනි පලතුරුද අපේ ගෙවත්තේ වගා කළ හැකි පෝෂ්‍ය ගුණයෙන් අනුන පලතුරු වර්ග ලෙස හඳුන්වන්න පුළුවන්. ගෙවත්තේ තිබෙන ඉඩකඩ අනුව පලතුරු වර්ගයන් වැඩි ප්‍රමාණයක් වගා කර ගැනීමෙන් විවිධත්වයෙන් යුතු පලතුරු, වසරේ වැඩි කාලයක් තුලදී අපේ ආහාර වේලට එකතුකර ගැනීමට පුළුවන්.

## හොඳ පලතුරු පැළයක්

මැංගුස්, පෙයාර්ස්, ඇපල්, මිදි වැනි පලතුරු වර්ග කීපයක් හැරුනාම අනිත් පලතුරු වර්ග ලංකාවේ ඕනෑම පළාතක වවන්න පුළුවන්. නමුත් ගුණාත්මයෙන් යුතු ඉහල අස්වැන්නක් සඳහා විවිධ දේශගුණික කලාපවලට ගැලපෙන ප්‍රභේද තෝරා ගැනීම වැදගත් වෙනවා. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිර්දේශිත පලතුරු ප්‍රභේද හා ඒවා වඩාත් සුදුසු ප්‍රදේශ දැන ගැනීමෙන් ඔබ එයින් වඩාත් කැමති වර්ග තෝරා ගැනීමට පුළුවන් (පසුපිට වගුව බලන්න).

පැළයක් මිලදී ගන්නා අවස්ථාවේදී වර්ගය, එහි ලක්ෂණ හා ඔබේ ප්‍රදේශයට සුදුසුදැයි විමසා බලා හොඳින් වර්ධනය වු, දිරිමත්, රෝග පළිබෝධ හානි වලින් තොර පැළයක් තෝරා ගන්න.

**බද්ධ පලතුරු පැළයක් සිටුවීමෙන්,**

- මව් ශාකයේ ලක්ෂණ සහිත පැළයක් ගත හැකියි.
- ඉක්මනින් පීදේ.
- ගස එතරම් විශාල නොවේ.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි පැළ තවානකින් පැළ ලබා ගැනීම වඩාත්ම සුදුසු වේ. එවැනි තවාන්වල අලිපේර, අඹ, රඹුටන්, දොඩම්, නාරං, දූරියන්, කොස් බද්ධ පැළ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් පරීක්ෂාකර සුදුසුනම් කහපාට ලේබලයක් ලබා දෙනවා. එවැනි ලේබල් යෙදු පැළ ලබා ගැනීම වඩාත් විශ්වාසදායකයි.

## පැළය සිටුවීමට සුදුසු ස්ථානය

පළතුරු පැළයක් සිටුවන ස්ථානය හොඳින් හිරුඑළිය ලැබෙන ස්ථානයක් වීම අනිවාර්යයි. නමුත් නිතරම දිය සීරාව පවතින තැනක් සුදුසු නැහැ. බොහෝ පලතුරු ගස් වල මල් පිපීමට වියළි කාලයක් අවශ්‍ය වෙනවා.

ගස් විශාලව වර්ධනය වන නිසා පසුකාලීනව ගෙවත්ත ඉන් සෙවන විය හැකි ආකාරය සලකා බැලිය යුතුයි. විශාලව වර්ධනය විය හැකි ගස් ඉඩමේ උතුරු කෙළවරට වන්නට වැට මායිමට කිට්ටුව පිහිටුවීමෙන් අනිකුත් බෝග වලට සෙවන වැටීම අඩුකරන්න පුළුවන්.

## සිටුවීම


සිටුවීමට සති 2කට පමණ පෙර සෙ.මි. 60 x සෙ.මි. 60 x සෙ.මි. 60 (අඩි 2 x අඩි 2 x අඩි 2) ප්‍රමාණයේ වලක් කපා ගන්න. තද පසක් සහිත හෝ පසේ ගැඹුර අඩුනම් මෙයට වඩා විශාල වලක් සුදුසුයි.

මෙය මතුපිට පස්, කොම්පෝස්ට්/දිරූ කාබනික පොහොර මිශ්‍රණයකින් පුරවා වල මුදුන් කර තබන්න.


පැළය සිටුවා ඇති පොලිතීන් කවරය ඉවත්කර පස් නොඉහිරෙන සේ (පස් කුට්ටිය සමඟම) වලේ මැද පැළය සිටුවන්න. පොලිතින් බඳුනේ තිබූ පස් මට්ටමට වඩා පැළයේ කඳ යට නොකරන්න.

මැංගුස්, දූරියන්, රඹුටන් වැනි පලතුරු පැළ සඳහා වර්ධනය මුල් කාලයේදී සෙවන සැපයීම අත්‍යාවශ්‍යයි. මේවාට සෙවන දැල්/පොල් අතු වැනි දෙයකින් සෙවන සපයන්න.

## නඩත්තුව



- ගස ඍජුව වර්ධනය කර ගැනීමට සිටවූ පැළය අසලින් පැළ නොවන කෝටුවක් ආධාරකයක් ලෙස සිටුවා පැළය එයට ප්‍රවේශමෙන් බඳින්න.
- බද්ධ පැළයක බද්ධ සන්ධියට පහලින් අළුතින් එන රිකිලි කුඩා කාලයේම කඩා ඉවත් කරන්න.
- ගස වර්ධනය වීමත් සමඟ කඳේ පාමුල සිට සෙ.මි. 50 - 75 මට්ටම දක්වා ඇති පාර්ශ්වික අතු ක්‍රමයෙන් ඉවත් කරන්න.
- ඉන්පසු හට ගන්නා අතුවලින් සෙ.මි. 15 - 20 පරතරයෙන් අතු 3 - 4 ක් විවිධ දිශාවන්ට පැතිරෙනසේ පුහුණු කරගන්න. අනවශ්‍ය අතු ඉවත්කර ගස මැදට හිරු එළිය ලැබීමට සලස්වන්න.




- පැළය හොඳින් අතු බෙදී වර්ධනය වනතුරු, හටගන්නා මල් කිනිති කඩා ඉවත් කරන්න.
- වැල් දොඩම්, මිදි වැනි වැල් වර්ගයන්ද ඩ්‍රැගන් ෆෘට් වැනි පලතුරු වර්ගයන්ද පුහුණු කර ගන්නා ආකාරය මින් වෙනස් වෙනවා.
- මාස 5 - 6 කට වරක් පමණ ගස වටා ප්‍රදේශයේ වල් පැළ ඉවත්කර කාබනික පොහොර නැවත යොදන්න. පොහොර යෙදීමේදී ගස පාමුල සිට සෙ.මි. 30-45 ක් පමණ දුර සිට ගසේ අතු විහිදී ඇති ප්‍රදේශය තුළ ගස වටා පොහොර විසුරුවා හැර ප්‍රවේශමෙන් පසට මිශ්‍ර කරන්න. කඳ ආසන්නයට කොළ රොඩු ගොඩකර තබන්න එපා.




- රසායනික පොහොර යෙදීම අවශ්‍ය වේ නම් ඒ සඳහා උපදෙස් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් ප්‍රකාශිත පලතුරු වගාවන් සම්බන්ධ ප්‍රකාශනයන් ගෙන් ලබා ගන්න පුළුවන්.
- සිටවූ මුල් කාලයේදී දිනපතා සහ පසුව අවශ්‍ය අවස්ථාවලදී ජලය සපයන්න.